## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශන  පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතුය. එසේ වුවද, 2020 මාර්තු 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුමේ පැවති රු. 63,331,928 ක්වූ බැර ශේෂ එදිනට පැවති හර ශේෂවලටද වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගිණුමේ පැවති රු.270,892 ක්වූ හර ශේෂ එදිනට පැවති බැර ශේෂවලටද හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණයන් සමග එකඟ වන අතර 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂයන්ට අදාල මූල්‍ය වාර්තා මගින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කෙරේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල සඳහන් ප්‍රතිපාදන අනුව මූල්‍ය වාර්තා පිළියෙල කළ යුතු බව හා ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 38 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියක් මගින් අවසර දී ඇත්නම් හෝ වෙනත් ආකාරයකින් අවශ්‍ය කෙරේ නම් හැර අස්තිත්වයක් විසින් මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකරන සියලුම වටිනාකම් සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරවු කළ යුතු වුවද ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් නිර්දේශයන්ට අදාළ අවශ්‍ය නිවැරදි කිරීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 106 (ඇ) ඡේදය ප්‍රකාරව, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශයෙහි වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇතුළත් ආයුගණක අලාභය සහ විදේශ විනිමය ලාභය වෙන වෙනම හෙළිදරවු කළ යුතු වුවද ඉන් බැහැරව රු.426,396,700 ක් වූ මුළු විස්තීර්ණ ආදායමම ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය තුළ දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 112 (ඈ) ඡේදය ප්‍රකාරව, පිළිවෙලින් රු.18,546,256 ක් හා රු.27,819,456 ක්වූ බැංකු ණය ජංගම නොවන හා ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර තිබුණද ඒ පිළිබඳ තොරතුරු සටහන් මගින් ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 හි 08 සහ 09 (ආ) ඡේද ප්‍රකාරව, 2020 දෙසැම්බර් 16 දිනට සමාගම සතු ආයුධාගාරයන්හි පාවිච්චියට නුසුදුසුයැයි හඳුනාගෙන තිබුණු රු.2,577,280 ක්වූ පතොරම්/ වෙඩිද්‍රව්‍ය/ තුවක්කු තොගය සමාලෝචිත වර්ෂයට අදාළව ගැලපීම් නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 25 හා 26 ඡේද ප්‍රකාරව, රාජ්‍ය ආයතන අනෙකුත් රාජ්‍ය ආයතන සමග පවතින ගනුදෙනු හා සම්බන්ධිත නොගෙවූ ශේෂ හෙළිදරව් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 (SLFRS 07) හි 14 වන ඡේදය ප්‍රකාරව, සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් ආරක්ෂක සේවාවක් ලබාදීම වෙනුවෙන් ඇප වශයෙන් තබා ස්ථිර තැන්පතු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 (SLFRS 07) හි 08 වන ඡේදය ප්‍රකාරව, සෑම කාණ්ඩයකටම අයත් මූල්‍ය වත්කම් හා වගකීම්වල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හෝ එහි සටහන් තුළින් හෙළිදරව් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2020 මාර්තු 31 වන විට රු.මිලියන 739.4 ක පිරිවැයක් දරා තිබුණද ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සැලසුම්කර තිබූ ඉඩමෙහි අයිතිය සමාගම වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල හානිකරණය සම්බන්ධයෙන්වූ වෙන්කිරීම්ද කර නොතිබුණි. | විගණන නිරීක්ෂණයන් සමග එකඟ වන අතර 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂයන්ට අදාල මූල්‍ය වාර්තා මගින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කෙරේ. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර හානිකරණය සම්බන්ධයෙන්වූ වෙන්කිරීම්ද කළ යුතු බව. |
| (ආ) | සී/ස ඇවන්ගාඩ් මැරිටයිම් සර්විස් (පුද්) සමාගම විසින් සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමට එරෙහිව සිංගප්පූරුවේ ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ පවරා තිබූ නඩුවේ තීන්දුව ලෙස වන්දි වශයෙන් ඇ.ඩො මිලියන 05 ක් හා සිංගප්පූර් ඩොලර් 826,000 ක් ගෙවන ලෙස සමාගමට 2016 නොවැම්බර් 24 දින නියම කොට තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මේ සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමක් හෝ ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනද සලසා නොතිබුණි. | -එම- | අධිකරණමය කටයුතු සඳහා අභියාචනා ඉදිරිපත් කිරීමක් හෝ ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා තිබිය යුතු බව. |
| (ඇ) | විගණනයට ලැබුණු තොරතුරු අනුව ගෙවිය යුතු බදු ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දක්වා තිබුණේ රු.200,181,662 ක හර ශේෂයක් වන අතර 2014/15 මූල්‍ය වර්ෂයේ දී ගෙවිය යුතු ආදායම් බදු ශේෂය 222,332,918 ක් විය. එය 2015/16 මූල්‍ය වර්ෂයේ සිට 2019/20 වර්ෂය දක්වාම හර ශේෂයන් ලෙස පෙන්නුම් කර තිබුණි. එසේම 2020.03.02 දිනැති අංක EPFS/COMM/2022/12 දරණ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් එවා තිබූ තහවුරු කිරීමේ ලිපියේ සඳහන් ගෙවිය යුතු බදු ශේෂයන් | -එම- | බදු ශේෂයන් නිවැරදිව ගණනය කළ යුතු බවත් ශේෂයන් අතර වෙනස්කම් සසඳා අවශ්‍ය ගැලපීම් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ ගෙවිය යුතු බදු ලෙස දක්වා තිබූ ශේෂයන් අතර වෙනස්වීම් නිරීක්ෂණය විය. | | |
| (ඈ) | පෙර වර්ෂයේ රු. 200,664,717 ක ගෙවිය යුතු ආදායම් බදු හර ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ද ගෙවිය යුතු ආදායම් බදු හර ශේෂයක් ලෙස රු.200,181,662 දක්වා තිබුණි. නමුත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2022 මාර්තු 10 දින ලබාගත් ශේෂ තහවුරු කිරීම් අනුව පෙර වර්ෂයේ ද එවැනි හර ශේෂයක් පවතින බව දක්වා නොතිබුණි. පෙර වර්ෂයේ ඉදිරිපත් කළ විගණන විමසුම සඳහා ද පිළිගත හැකි පිළිතුරක් ඉදිරිපත් කර නොතිබුණු අතර රු.2,599,788 ක ආදායම් බද්දක් ගෙවා තිබූ බව පමණක් දක්වා තිබුණි. එහෙත් ගිණුම්වල ඒ වෙනුවෙන් අඩමාණ ණය සඳහා අවශ්‍ය වෙන්කිරීම් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල උපයන විට බදුවල රු.54,829 හර ශේෂයක් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ද උපයන විට බදුවල රු.308,065 හර ශේෂයක් දක්වා තිබුණි. දේශීය ආදායම් කොමසාරිස් වෙතින් ලබාගත් ශේෂ සනාථන ලිපිය අනුව පෙර වර්ෂයේ එවැනි හර ශේෂයක් පවතින බව දක්වා නොතිබුණි. එහෙත් ගිණුම්වල ඒ වෙනුවෙන් අඩමාණ ණය සඳහා අවශ්‍ය වෙන්කිරීම් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ විලම්භිත බදුහර ශේෂය රු.73,643,559 ක් වූ අතර පෙර වර්ෂයේ එම ශේෂය රු.12,929,036 ක්වී තිබුණි. පෙර වර්ෂය හා සාපේක්ෂව රු. 60,714,523 කින් සමාලෝචිත වර්ෂයේ විලම්භිත බදු හර ශේෂය වැඩිවී තිබුණි. එසේම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිගුකාලීන ජංගම නොවන වගකීම් යටතේ විලම්භිත බදු හර ශේෂය දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | | | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ , ස්ථාවර වත්කම් සහ තොග | 2,732 | ශේෂ සනාථ කිරීම් හා භෞතික තොග සත්‍යාපන වාර්තා | විගණන නිරීක්ෂණයන් සමග එකඟ වන අතර 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂයන්ට අදාල මූල්‍ය වාර්තා මගින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කෙරේ. | ශේෂ සනාථ කිරීම් හා භෞතික තොග සත්‍යාපන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු බව. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 මාර්තු 31 දිනට පැවති රු. 2,674,767,444 ක්වූ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයෙන් රු.1,784,594,523 ක් සමුද්‍රීය ආරක්ෂණ සේවා සැපයීමෙන් ලැබිය යුතු ණය ශේෂය විය. ඉන් රු.1,631,525,702 ක් එනම් මුළු ණය සියයට 91.4 ක් ඇවන්ගාඩ් ආයතනයෙන් ලැබිය යුතු ණය ශේෂය විය. රංගල හා ගාල්ල පාවෙන අවි ගබඩා තුළින් ලැබිය යුතු පිළිවෙලින් රු.83,868,069 ක් හා රු.377,764,559 ක්වූ ශේෂ වර්ෂ 07 කට අධික කාලයක සිට අයනොවී තිබූ අතර එම ශේෂයන් තහවුරු කරගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර එම ණය අයකරගැනීමටද කටයුතු කර නොතිබුණි. | -එම- | අදාළ ණය ශේෂයන් අයකරගැනීමට හා තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ණය ශේෂයන්හි කාල විශ්ලේෂණය අනුව ආයතන 89 කින් වසර 05 ට වැඩි කාලයක සිට ලැබිය යුතු ණය ශේෂය රු.1,454,554,288 ක් පැවතියද, අදාළ ණය ශේෂ අයකර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | රක්නා ලංකා ආරක්ෂක සමාගමේ ප්‍රධානතම ආදායම් මාර්ගය දේශීය හා සමුද්‍රීය ආරක්ෂක සේවා සැපයීම වුවද, එම ආදායම් නිසි පරිදි ඉන්වොයිස් කර අදාල ආයතන වෙත යවා, එය විධිමත්ව කළමනාකරණයට හා පාලනයට සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේද ස්ථාපිත කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | -එම- | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වාදීම හා එය ක්‍රියාත්මක කළ යුතු බව. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ඇවන්ගාඩ් සමාගමට ගෙවිය යුතු රු. 762,831,040 ක්වූ වගකීම් සනාථ කිරීමට අවශ්‍ය ශේෂ සනාථ කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් නොවුණි. | විගණන නිරීක්ෂණයන් සමග එකඟ වන අතර 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂයන්ට අදාල මූල්‍ය වාර්තා මගින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කෙරේ. | ශේෂ සනාථ කිරීම් හා අදාළ ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය | සමාගමේ ශේෂ පත්‍ර දිනයෙන් පසුව මාස 06 ක් ඇතුළත හෝ රෙජිස්ටාර්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි දීර්ඝ කරන ලද යම් කාලයක් ඇතුලත, මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කර ඇති බවටත් මූල්‍ය | විගණන නිරීක්ෂණයන් සමග එකඟ වන අතර 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂයන්ට අදාල මූල්‍ය වාර්තා මගින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට | නීති රීති හා රෙගුලාසිවලට අනුව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාශන වගකිවයුතු පුද්ගලයෙකු විසින් එය පනතේ නියමයන්ට අනුකූලව වන බව සහතික කර ඇති බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සමාගමේ අධ්‍යක්ෂවරයන් දෙදෙනෙකු විසින් දින යොදා අත්සන් කර ඇති බවටත් අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගබලා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර 2020 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් අත්සන් කර තිබුණේ 2022 අප්‍රේල් 29 දීය. | කටයුතු කෙරේ. | කළ යුතු බව. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ චක්‍රලේඛය | | | |
| (i) | 5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | -එම- | සංයුක්ත සැලැස්මක් පිළියෙල කල යුතු බව. |
| (ii) | 6.5.1 ඡේදය | සමාගම විසින් ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත හා පිටපත් අදාල අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසාන මූල්‍ය ප්‍රකාශන වර්ෂ 01 මාස 10 ක් ක ප්‍රමාදයක් සහිතව 2022 අප්‍රේල් 29 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | -එම- | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 6.5.3 ඡේදය | 2017/18 හා 2018/19 වර්ෂයන් සඳහාවූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | -එම- | වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කළ යුතු බව. |
| (iv) | 7.4.1 ඡේදය | වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් අවම වශයෙන් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි. | -එම- | රැස්වීම් වාර නියමිත කාල සීමාව තුළ පැවැත්වීමට කටයුතු කළ යුතු බව. |
| (v) | 7.4.5 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා 2020 මාර්තු 31 දිනට වූ ස්ථාවර වත්කම් සත්‍යාපනය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර යාවත්කාලීන කර නොතිබුණි. | -එම- | ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කිරීම හා එය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු බව. |
| (vi) | 9.3 ඡේදය | සමාගම සංස්ථාපනය කළ දින සිට මේ දක්වා සේවක මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කරවා ගෙන නොතිබුණි. | -එම- | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කිරීමටත් එය අනුමත කරවා ගැනීමටත් කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 271,577,352 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 129,489,498 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 142,087,854 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම සියයට 52 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ප්‍රචාරණ වියදම පිළිවෙලින් රු.195,125 ක් හා රු.1,837,232 ක්වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 841 කින් වැඩිවී තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අඩමාණ ණය වියදම පිළිවෙලින් රු.5,952,538 ක් හා රු.17,506,520 ක්වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 194 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මාර්තු 31 දිනට පාවිච්යට නුසුදුසු ගිනි අවි හා උපාංග පිළිවෙලින් ඒකක 254 ක් හා 714 ක් සඳහා වූ අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන තිබුණද මේ දක්වාම අවසන් වී නොතිබුණි. | විගණන නිරීක්ෂණයන් සමග එකඟ වන අතර 2020/2021 හා 2021/2022 මූල්‍ය වර්ෂයන්ට අදාල මූල්‍ය වාර්තා මගින් අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කෙරේ. | ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු බව. |